# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.03.28 පැය 2055 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 600 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ජාතික පොලිස් අභ්‍යාස ආයතනය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම - ජාතික පොලිස් අභ්‍යාස ආයතනය.**

ජාතික පොලිස් අභ්‍යාස ආයතනය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) එක්ව දිවයිනේ ළමුන් හා කාන්තාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන් සඳහා වූ අවශ්‍ය දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

මෙම පුහුණු වැඩසටහන ළමා හා කාන්තා කාර්යාංශ වල 2500 ක් පමණ වූ පොලිස් නිලධරයන් වෙනුවෙන් කෙටි, අතරමැදි හා ඩිප්ලෝමා වශයෙන් කොටස් තුනකින් පැවැත්වීමට නියමිත අතර, පුහුණු වැඩමුළුව සාර්ථක කර ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ අවබෝධතා ගිවිසුමක් කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ විධායක අධ්‍යක්ෂ නියෝජ්‍ය පොලිස්පති ජාලිය සේනාරත්න මහතා හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ආසියාතික සංවර්ධන පදනම අතර 2025 මාර්තු මස 28 වන අද දින අත්සන් කරන ලදී.

මෙම අවස්ථාව සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නියෝජිතයින් හා කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ විධායක අධ්‍යක්ෂ නියෝජ්‍ය පොලිස්පති ජාලිය සේනාරත්න මහතා, ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශයේ නියෝජ්‍ය පොලිස්පතිනි රේණුකා ජයසුන්දර මහත්මිය ඇතුලු උසස් පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම අවස්ථාවට අදාළ ඡායාරූප කිහිපයක්













**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**